# Pre-Sevice teacher training programme scheduled for the newly recurited graduate teachers under 13 Year Guaranteed Education Programme

## 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන සඳහා බඳවා ගත් නවක ගුරුවරුන් සඳහා වූ නේවාසික පූර්ව සේවා ගුරු පුහුණු වැඩසටහන - 2018

රජයේ ප්‍රමුඛ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති ඉහත වැඩසටහන යටතේ හඳුන්වා දුන් නව වෘත්තීය විෂය 26 ඉගැන්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් බඳවා ගෙන ඇති නවක උපාධිධාරී ගුරුවරුන් සඳහා පූර්ව සේවා ගුරු පුහුණු වැඩසටහනක් ඒ ඒ විෂය කාණ්ඩ යටතේ තෝරාගත් පහත සඳහන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල දී 2018.08.06 සිට 2018.08.24 දක්වා ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය එක්ව සැලසුම් කර ඇත.

| විෂය කාණ්ඩය | | විෂයය | | තෝරාගත් විද්‍යා පීඨය |
|---|---|---|---|---|
| 1 | සෞඛ්‍ය හා සමාජ සේවා | 1 | ළමා මනෝවිද්‍යාව හා ආරක්ෂණය | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| | | 2 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | |
| | | 3 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | |
| 2 | සමාජ සංස්කෘතික අධ්‍යයන | 4 | ප්‍රාසාංගික කලාව | වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| | | 5 | කාර්යසිද්ධි කළමණාකරණය | |
| | | 6 | ශිල්ප කලා | |
| 3 | නිර්මාණකරණය | 7 | අභ්‍යන්තර නිර්මාණකරණය | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| | | 8 | විලාසිතා නිර්මාණකරණය | |
| | | 9 | ග්‍රැෆික් නිර්මාණකරණය | |
| | | 10 | කලාව හා පිරිසැලසුම්කරණය | |
| | | 11 | භූ දර්ශණ නිර්මාණකරණය | |
| 4 | කෘෂි හා ආහාර තාක්ෂණවේදය | 12 | ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| | | 13 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | |
| | | 14 | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | |
| | | 15 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | |
| | | 16 | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | |
| 5 | තාක්ෂණික අධ්‍යයන | 17 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | |
| | | 18 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | |
| | | 19 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | |
| | | 20 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | |
| | | 21 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | |
| | | 22 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | |
| 6 | සංචරණය හා ආගන්තුක සත්කාර සේවා | 23 | සංචරනය හා ආගන්තුක සත්කාර | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 7 | පරිසරය ආශ්‍රිත අධ්‍යයන | 24 | පාරිසරික අධ්‍යයනය | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |
| 8 | වෙබ් නිර්මාණකරණය හා මෘදුකාංග සංවර්ධනය | 25 | මෘදුකාංග සංවර්ධනය | |
| | | 26 | වෙබ් නිර්මාණකරණය | |
| 9 | දෙමළ මාධ්‍ය ගුරුවරුන් සඳහා (සියලු විෂය කාණ්ඩ) | | | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය |

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා පුරෝගාමීන් ලෙස තෝරාගෙන ඇති ගුරුවරුනට පාසල තුළ ඔවුන්ගේ කාර්යය වඩාත් සාර්ථකව ඉටුකිරීම සඳහා මගපෙන්වනු වස් එම වැඩසටහන පහත සඳහන් පරිදි අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

| පුහුණු වැඩසටහන | අන්තර්ගතය | දින ගණන | කාල සීමාව | ස්ථානය |
|---|---|---|---|---|
| අදියර 1 | නවක උපාධිධාරී ගුරුවරුන් පුහුණු කිරීම සඳහා සකස් කළ අධ්‍යාපන මූලධර්ම, ඉගෙනුම් ක්‍රමවේද, ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ භාවිතය වැනි සුවිශේෂී තේමා | 19 | 2018.08.06 සිට 2018.08.24 | ඒ ඒ විෂය කාණ්ඩයවලට අයත් විෂය අනුව තෝරාගත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල දී |
| අදියර 2 | වෘත්තීය විෂය අන්තර්ගතය, තක්සේරුකරණ ක්‍රමවේද හා ප්‍රායෝගික පුහුණුව | 10 | 2018.08.27 සිට 2018.09.05 | ඒ ඒ විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව සඳහා තෝරාගත් විවිධ ආයතනවල දී හා ජාතික අධ්‍යාපන ආයතනයේ දී |

ඒ අනුව අදාළ පුහුණු වැඩසටහන සඳහා 2018.08.06 දින පෙ.ව. 9.30ට පෙර පහත සඳහන් ද්‍රව්‍ය රැගෙන අදාළ විද්‍යාපීඨයට වාර්තා කිරීම අපේක්ෂා කෙරේ.

*රැගෙන ආ යුතු භාණ්ඩ ලැයිස්තුව*

1. දින 19ක් නේවාසික වීමට අවශ්‍ය ඇඳුම් හා අනෙකුත් ද්‍රව්‍ය
2. තුවා ඇඳ ඇතිරිලි (කොට්ට අවශ්‍ය නම්)
3. අධ්‍යයන සැසි සඳහා ඇඳුම

   කාන්තා - සාරි-හැට්ට (සුදු වර්ණය වඩාත් සුදුසුයි) කොණ්ඩය හොඳින් පීරා බැඳිය යුතුය.

   පිරිමි - කළු කලිසම, සුදු හෝ ලා පැහැති කමිසය (කරපටිය අවශ්‍ය වන විට) කොණ්ඩය,රැවුල හොඳින් කපා තිබිය යුතුය.
4. ක්‍රීඩා කටයුතු සඳහා ඇඳුම් කාන්තා, පිරිමි (බොටම්, ටීෂර්ට්, සපත්තු, මේස්)
5. සෞන්දර්ය විෂයයන් සඳහා ඇඳුම්

   නැටුම් සඳහා භාවිතා කරන ඇඳුම් (ජීන්ස්, දක්ෂතා දක්වා ඇති නැටුම් වේ නම් ඒ සඳහා භාවිතා කළ ඇඳුම් හැකිනම්)

   චිත්‍ර සඳහා පැස්ටල් පෙට්ටියක්, පැන්සල්, මකන

   ඔබ ප්‍රගුණ කර ඇති සංගීත භාණ්ඩයක් උදා : බටනලාව ආදිය ගෙන ඒමට හැකි නම්